000111

IHRA
UNIVERSITY OF COLOMBO

**මානව සම්පත් අභිවර්ධන ආයතනය**

**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - II කොටස - 2018/2019**

**(ප්‍රථම සෙමෙස්තරය)**

**(පවත්වන ලද්දේ 2021 මාර්තු)**

# BLE 201 - සාර්ව ආර්ථික විද්‍යාව

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සහ පිටු තුනකින් (03) සමන්විත වේ.

(2) පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර, අනෙකුත් ප්‍රශ්න පහෙන් (05) හතරකට (04) පිළිතුරු සපයන්න.

(3) පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන පහකි (05).

(4) කාලය පැය තුනයි. (03)

(5) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(6) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01. පහත දක්වා තිබෙන්නේ එක්තරා ආර්ථිකයක සාර්ව ආර්ථික විචල්‍ය කිහිපයක් සම්බන්ධ තොරතුරුය.

- පරිභෝජනය $C = 40+0.6Y$
- ආයෝජනය $I = 150$
- රජයේ වියදම් $G = 200$
- අපනයන $X = 70$
- ආනයන $M = 44 + 0.28Y$

මෙම තොරතුරු භාවිතා කොට මෙම ආර්ථිකය සම්බන්ධයෙන් වූ පහත සඳහන් අගයන් ලබාගන්න.

i. සමතුලිත නිෂ්පාදනය (ලකුණු 03)

ii. සමතුලිත නිෂ්පාදනයේ පරිභෝජනය (ලකුණු 03)

iii. සමතුලිත නිෂ්පාදනයේ ඉතුරුම් (ලකුණු 02)

iv. සමතුලිත නිෂ්පාදනයේ ආනයන වියදම (ලකුණු 02)

v. සමතුලිත නිෂ්පාදනයේ සමාහාර ඉල්ලුම (ලකුණු 02)

vi. ස්වාධීන පරිභෝජන වියදම් ගුණකය (ලකුණු 02)

vii. ස්වාධීන ආයෝජන වියදම් ගුණකය (ලකුණු 01)

viii. රජයේ වියදම් ගුණකය (ලකුණු 01)

ix. ස්වාධීන ආනයන වියදම් ගුණකය (ලකුණු 02)

x. රජයේ වියදම් 200 සිට 250 දක්වා වැඩි වූයේ නම්, නව සමතුලිත නිෂ්පාදනය ගණනය කරන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 20)

02.

i. දළ දේශීය නිෂ්පාදනය සහ දළ ජාතික ආදායම අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ii. චේතනා තුනක් මුල්කරගෙන කුටුම්බ හා ආයතන මුදල් ඉල්ලුම් කරනු ලබන බව කේන්ස් නැමැති ආර්ථික විද්‍යාඥයා සඳහන් කළේය.
මුදලට ඉල්ලුමක් ඇති වීම කෙරෙහි බලපාන එම චේතනා තුන (03) පැහැදිලි කරන්න.

(ලකුණු 06)

iii. වෘත්තාකාර ප්‍රවාහය ආශ්‍රයෙන් විවෘත ආර්ථිකයක, ආර්ථික ඒකක අතර අන්තර් සම්බන්ධතාවය විග්‍රහ කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

03.

i. උද්ධමනය යනු කුමක්ද? උද්ධමනය මනින ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 03)

ii. ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනය සහ පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 08)

iii. උද්ධමනයෙන් පුද්ගලයන්ට, ව්‍යාපාරයට සහ ආර්ථිකයට ඇතිවිය හැකි අහිතකර ප්‍රතිවිපාක පැහැදිලි කරන්න.

(ලකුණු 09)

**(මුළු ලකුණු 20)**

**04.**

i. විශේෂීකරණය අන්තර්ජාතික වෙළඳාමට බලපාන අයුරු විග්‍රහ කරන්න.

(ලකුණු 04)

ii. අන්තර්ජාතික වෙළඳාම හේතුවෙන් ආර්ථිකයක් අත් කරගන්නා වාසි සහ අවාසි සංසන්දනය කරන්න.

(ලකුණු 06)

iii. සාපේක්ෂ සහ නිරපේක්ෂ න්‍යාය යොදාගනිමින් දෙරටක් අතර වෙළඳාමේ යෙදීමේ වාසි උදාහරණයක් යොදාගෙන පෙන්වා දෙන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**05.**

i. ස්ථාවර විදේශ විනිමය අනුපාතික ක්‍රමය සහ නම්‍ය විදේශ විනිමය අනුපාතික ක්‍රමය සංසන්දනය කරන්න.

(ලකුණු 08)

ii. විනිමය අනුපාතිකය අවප්‍රමාණය සහ පිරිහීම අතර වෙනස පෙන්වා දෙන්න.

(ලකුණු 06)

iii. විදේශ විනිමය වෙළඳපොල සහ එහි පාර්ශවකරුවන් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

**(මුළු ලකුණු 20)**

**06.** පහත සංකල්ප කෙටියෙන් පැහැදිලි කරන්න.

i. සාර්ව ආර්ථික ප්‍රතිපත්ති

ii. ජාතික ගිණුම්කරණයේ සීමා

iii. ආන්තික පාරිභෝජන නැඹියාව

iv. මුදලේ කාර්යයන්

**(ලකුණු 5 X 4 - 20)**

************************************

000192

IHRA
UNIVERSITY OF COLOMBO

**මානව සම්පත් අභිවර්ධන ආයතනය**

**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - II කොටස - 2018/2019**

**(ප්‍රථම සෙමෙස්තරය)**

**(පවත්වන ලද්දේ 2021 මාර්තු)**

# BLE 202 – තොරතුරු සන්නිවේදන තාක්ෂණය II

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) **ප්‍රශ්න සියල්ලටම** පිළිතුරු සැපයිය යුතුයි.

(2) ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතරකින් (04) සහ පිටු දහහතරකින් (14) සමන්විත වේ

(4) කාලය පැය තුනයි (03)

(5) ගණක යන්ත්‍ර භාවිතා කළ නොහැක.

(6) ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් බැහැරට ගෙනයාම සපුරා තහනම් වේ.

(7) සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු හිමිවේ.

(8) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(9) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

## Question 1

1. Briefly explain how to use the AutoFill feature of Excel to enter the days as follows. (පහත දැක්වෙන පරිදි දින ඇතුළත් කිරීමට එක්සෙල් හි ස්වයංක්‍රීයව පුරවන (AutoFill) ආකාරය කෙටියෙන් විස්තර කරන්න.)

[2 Marks]

| | A | B | C | D | E | F |
|---|---|---|---|---|---|---|
| 1 | | | | | | |
| 2 | 1st Day | 2nd Day | 3rd Day | 4th Day | 5th Day | 6th Day |
| 3 | | | | | | |

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

2. Write down two different formulas to get the total of the Items. (මුළු Items එකතුව ලබා ගැනීම සඳහා විවිධ සූත්‍ර (formulas) දෙකක් ලියන්න)

[2 Marks]

| | A | B | C |
|---|---|---|---|
| 1 | Item | Amount | |
| 2 | Item A | 567 | |
| 3 | Item B | 234 | |
| 4 | Item C | 542 | |
| 5 | Item D | 123 | |
| 6 | Total | 1466 | |
| 7 | | | |

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

3. Write down two methods necessary to add the following, non-consecutive cells: (Excel හි පහත සඳහන් අඛණ්ඩ නොවන cell වල අගයන් එකතු කිරීමට අවශ්‍ය ක්‍රම දෙකක් ලියන්න: C3, D3, E3, H5.)

[2 Mark]

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

4. Write down using the non-consecutive addition formula to display your answer in cell A4. The numbers are given in the following cells: (පහත දීස්වන Excel Cells හි ඇති සංඛ්‍යා වල එකතුව B4 කොටුව තුළ ප්‍රදර්ශනය කිරීම සඳහා අඛණ්ඩ නොවන එකතු කිරීමේ සූත්‍රයක් භාවිතා කර ලියන්න.)

[3 Marks]

| | D | E | F | G | H | I |
|---|---|---|---|---|---|---|
| 1 | 35 | 26 | 22 | 18 | 98 | |
| 2 | | | 12 | 16 | 19 | |
| 3 | | | | | | |

5. Write down the formula using PRODUCT to multiply values in cells D4 to E8, C4, and C5. (E4 සිට B8 Cells වල සහ C4 සහ C5 Cells වල අගයන් ගුණ කිරීම සඳහා "PRODUCT" භාවිතා කරමින් සූත්‍රය ලියන්න.)

[2 Mark]

6. How do you create dropdown lists in Excel? (එක්සෙල් හි Dropdown list නිර්මාණය කරන්නේ කෙසේද යන්න විස්තර කරන්න.)

[2 Mark]

7. In case you don't want to modify the cell addresses when they are copied, what should you do? Explain using an example. (Cell ලිපින පිටපත් කරන විට ඒවා වෙනස් කිරීමට ඔබට අවශ්‍ය නැතිනම් ඔබ කළ යුත්තේ කුමක්ද? උදාහරණයක් භාවිතා කරමින් පැහැදිලි කරන්න.)

[2 Mark]

8. What is the operator precedence of formulas in Excel? (Excel හි Operators ක්‍රි කරන ප්‍රමුඛතාවය (precedence of formulas)කුමක්ද?)

[2 Mark]

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

9. Explain SUM and SUMIF functions. (SUM සහ SUMIF කාර්යයන් පැහැදිලි කරන්න.)

[2 Mark]

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

10. Write down the formula to calculate the sum of goals scored only by Kumara. (කුමාර විසින් පමණක් ලබාගත් Goals එකතුව ගණනය කිරීම සඳහා formula එක ලියන්න.)

[3 Marks]

| | D | E | F |
|---|---|---|---|
| 1 | Name | Goals | |
| 2 | Kumara | 3 | |
| 3 | Perera | 2 | |
| 4 | Gayan | 1 | |
| 5 | Kumara | 3 | |
| 6 | Sarath | 1 | |
| 7 | | | |
| 8 | Kumara's Goals | 6 | |

..................................................................................................................................

..................................................................................................................................

11. Write down three (03) different types of COUNT functions available in Excel with suitable examples? (Excel හි ඇති විවිධ වර්ගයේ COUNT functions තුනක් (03) සුදුසු උදාහරණ සහිතව ලියන්න)

[3 Mark]

..................................................................................................................................

..................................................................................................................................

## Question 2

1. Write down two different formulas to get the day expenditure of the Tuesday'. (අඟහරුවාදා දින වියදම (day expenditure)ලබා ගැනීම සඳහා විවිධ සූත්‍ර දෙකක් ලියන්න)

[2 Marks]

| | A | B | C |
|---|---|---|---|
| E15 | | | |
| 1 | | Total Payments | |
| 2 | | | |
| 3 | | Tuesday | |
| 4 | Lunch | 150 | |
| 5 | Taxi | 300 | |
| 6 | Books | 270 | |
| 7 | Other | 350 | |
| 8 | | | |
| 9 | Day expenditure | 1070 | |
| 10 | | | |

..........................................................................................................................

..........................................................................................................................

2. Write down the correct formula and procedure to display the sum of the range B2:B8 may not exceed the budget limit of $100. (අයවැය සීමාව ඩොලර් 100 නොඉක්මවිය හැකිය වෙන පරිදි B2: B8 පරාසයේ එකතුව පෙන්වීම සඳහා නිවැරදි formula එක සහ ක්‍රියා පටිපාටිය ලියන්න)

[2 Mark]

..........................................................................................................................

..........................................................................................................................

3. Give the proper expression to perform the following grades that the student has obtained (Grades are in a separate worksheet). (ශිෂ්‍යයා ලබා ඇති පහත දැක්වෙන ශ්‍රේණි නිසි ලෙස දැක්වීම සඳහා සුදුසු ප්‍රකාශනය (expression) ලියන්න.) (සටහන: Grades වෙනම worksheet එකක ඇත.)

    **FAIL** If the student scores below 40
    **D** If the student scores 40 to 54
    **C** If the student scores 55 to 69
    **B** If the student scores 70 to 74
    $A^-$ If the student scores 75 to 79
    A If the student scores 80 to 89
    **$A^+$** If the student scores 90 or above

[2 Mark]

..........................................................................................................................

..........................................................................................................................

## Question 2

1. Write down two different formulas to get the day expenditure of the Tuesday'. (අඟහරුවාදා දින වියදම (day expenditure)ලබා ගැනීම සඳහා විවිධ සූත්‍ර දෙකක් ලියන්න)

[2 Marks]

| | A | B | C |
|---|---|---|---|
| E15 | | $f_x$ | |
| 1 | | Total Payments | |
| 2 | | | |
| 3 | | Tuesday | |
| 4 | Lunch | 150 | |
| 5 | Taxi | 300 | |
| 6 | Books | 270 | |
| 7 | Other | 350 | |
| 8 | | | |
| 9 | Day expenditure | 1070 | |
| 10 | | | |

..............................................................................................................................

..............................................................................................................................

2. Write down the correct formula and procedure to display the sum of the range B2:B8 may not exceed the budget limit of $100. (අයවැය සීමාව ඩොලර් 100 නොඉක්මවිය හැකිය වෙන පරිදි B2: B8 පරාසයේ එකතුව පෙන්වීම සඳහා නිවැරදි formula එක සහ ක්‍රියා පටිපාටිය ලියන්න)

[2 Mark]

..............................................................................................................................

..............................................................................................................................

3. Give the proper expression to perform the following grades that the student has obtained (Grades are in a separate worksheet). (ශිෂ්‍යයා ලබා ඇති පහත දැක්වෙන ශ්‍රේණි නිසි ලෙස දැක්වීම සඳහා සුදුසු ප්‍රකාශනය (expression) ලියන්න.) (සටහන: Grades වෙනම worksheet එකක ඇත.)

    **FAIL** If the student scores below 40
    **D** If the student scores 40 to 54
    **C** If the student scores 55 to 69
    **B** If the student scores 70 to 74
    $A^-$ If the student scores 75 to 79
    A If the student scores 80 to 89
    **$A^+$** If the student scores 90 or above

[2 Mark]

..............................................................................................................................

..............................................................................................................................

4. Write down the expression to display "Ok" if the name is "Nimal" and "Not Ok" if the name is not "Nimal". (නම "Nimal" නම් "Ok" සහ නම "Nimal" නොවේ නම් "Not Ok" යන්න පෙන්වීමට ප්‍රකාශනය ලියන්න.)

[2 Mark]

| | A | B | C |
|---|---|---|---|
| 1 | Nimal | Ok | |
| 2 | Kumara | Not Ok | |
| 3 | Mala | Not Ok | |
| 4 | | | |

.....................................................................................................................

.....................................................................................................................

5. Write down the proper Excel expression to display Nimal Perera's Salary, whose first name is Nimal and the last name is Perera. (නිමල් පෙරේරාගේ වැටුප ප්‍රදර්ශනය කිරීම සඳහා Excel expression එක ලියන්න, එහි මුල් නම නිමාල් සහ අවසාන නම පෙරේරා ය.)

[2 Mark]

| ID | First Name | Last Name | Salary | | |
|---|---|---|---|---|---|
| 45 | Nimal | Perera | 54660 | First Name | Nimal |
| 56 | Gayan | Kumarage | 52000 | Last Name | Perera |
| 14 | Nimal | Gunasekara | 76000 | | |
| 78 | Kusum | De Silva | 75000 | Salary | 54660 |
| 58 | Sumal | Hettiarachchi | 45000 | | |
| 63 | Sumal | Perera | 43980 | | |

.....................................................................................................................

.....................................................................................................................

6. Write down a formula to display the highest total within the given cell range. The cell ranges are C16:C18 and D16:D18. (දී ඇති cell පරාසය තුළ ඉහළම එකතුව පෙන්වීමට සූත්‍රයක් (formula) ලියන්න. Cell පරාසයන් C16: C18 සහ D16: D18 වේ. )

[2 Mark]

| | A | B | C | D | E |
|---|---|---|---|---|---|
| 15 | | | | | |
| 16 | | | 12 | 23 | |
| 17 | | | 34 | 13 | |
| 18 | | | 56 | 45 | |

.....................................................................................................................

7. we have a simple task list with a date complete in column D. In column E, we have a formula that checks cells in column D to see if they are empty or not. When a cell is blank, the formula assigns a status of "Open". If the cell contains a value (a date in this case, but it could be anything), the formula will assign a status of "Closed" as shown below. Write down the formula to fulfill the above requirement. (D තීරුවේ task list එක සම්පූර්ණ කරන ලද දිනය සහිත සරල කාර්ය ලැයිස්තුවක් ඇත. E තීරුවේ, D තීරුවේ ඇති cells හිස්ද නැද්ද යන්න පරීක්ෂා කරන function එකක් ඇත. කොටුවක් හිස් වූ විට, Function එක "විවෘත" යන තත්වය පෙන්වයි. කොටුවේ අගයක් තිබේ නම් (මෙය දිනයක් හෝ, ඕනෑම දෙයක් විය හැකිය) formula එක පහත දැක්වෙන පරිදි "සංවෘත" යන තත්වය පෙන්වයි. ඉහත අවශ්‍යතාවය සපුරාලීම සඳහා සූත්‍රය ලියන්න.)

[2 Mark]

| | A | B | C | D | E |
|---|---|---|---|---|---|
| 1 | | | | | |
| 2 | | IF Function | Status | Remarks | |
| 3 | | | Closed | 1/11/2020 | |
| 4 | | AGM Preparation List | Open | | |
| 5 | | Directors report to be finalised and send for review | Open | | |
| 6 | | Finalize Annual report | Closed | 10/11/2020 | |
| 7 | | AGM Notice | Open | | |
| 8 | | Prepare Attendance register | Closed | 20/11/2020 | |
| 9 | | Ready the documents needed | Open | | |
| 10 | | Follow up with Auditors | Open | | |

....................................................................................................................................................

....................................................................................................................................................

8. Write down the formulas/steps to calculate/create the following (16-26) using the given interface of Excel. Note: Use **correct** cell addresses as much as possible when calculating them. Write down the assumption on the given blank column before using them with the answer. (දී ඇති Excel interface එක භාවිතා කරමින් පහත සඳහන් (16-26) ගණනය කිරීමට / නිර්මාණය කිරීමට සූත්‍ර (formula) / පියවර (step) ලියන්න. *සටහන: ගණනය කිරීමේදී හැකි තරම් නිවැරදි cell ලිපින භාවිතා කරන්න. පිළිතුර භාවිතා කිරීමට පෙර, දී ඇති හිස් තීරුවේ උපකල්පනය (assumption) සටහන් කරන්න.)

[from question i to ix: 1 x 9 =9 Marks]

| | M | N | O | P | Q |
|---|---|---|---|---|---|
| 43 | | | | | |
| 44 | | Name | Marks | Grades | Pass/Fail |
| 45 | | Mala | 45 | | |
| 46 | | Nimal | 67 | | |
| 47 | | Sarath | 87 | | |
| 48 | | Gamini | 23 | | |
| 49 | | Kumari | 67 | | |
| 50 | | Bandara | 56 | | |
| 51 | | Chandana | 93 | | |
| 52 | | Amal | 34 | | |
| 53 | | Dinesh | 49 | | |
| 54 | | Perera | 68 | | |
| 55 | | Bandara | 56 | | |

i. Find the Maximum Marks (උපරිම ලකුණු සොයා ගන්න)

..........................................................................................................

..........................................................................................................

ii. Find the Minimum Marks (අවම ලකුණු සොයා ගන්න)

..........................................................................................................

..........................................................................................................

iii. Arrange student name according to the ascending order (ආරෝහන (නැගී එන) පිළිවෙල අනුව සිසුන්ගේ නම සකසන්න)

..........................................................................................................

..........................................................................................................

iv. Calculate the average of the class (පන්තියේ සාමාන්‍යය ගණනය කරන්න)

..........................................................................................................

..........................................................................................................

v. Display "Pass" under the respective column for those who obtain marks more than 50 and others as "Fail". (50 ට වඩා ලකුණු ලබා ගන්නා අය "Pass" සහ අනෙක් අය "Fail" ලෙස අදාළ තීරුව යටතේ පෙන්වන්න.)

..........................................................................................................

..........................................................................................................

vi. Count the no of students using their names (නම් භාවිතාකර සිසුන්ගේ එකතුව ගණනය කරන්න)

..........................................................................................

..........................................................................................

vii. Count all cells in the range whose second character of the name is the letter "a". (නමේ දෙවන අක්ෂරය "a" වන අක්ෂරයේ පරාසය තුළ ඇති සියලුම cells ගණන් කරන්න.)

..........................................................................................

..........................................................................................

viii. Rank the students according to their marks (සිසුන්ගේ ලකුණු අනුව ශ්‍රේණිගත කරන්න)

..........................................................................................

..........................................................................................

ix. Calculate the total marks of all the students (සියලුම සිසුන්ගේ මුළු ලකුණු ගණනය කරන්න)

..........................................................................................

..........................................................................................

x. Assign grades using the "If" condition ("A" If the student scores 80 or above, "B" If the student scores 60 to 79, "C" If the student scores 45 to 59, "D" If the student scores 30 to 44, "FAIL" If the student scores below 30) ("If" condition භාවිතා කරමින් grades assign කරන්න ("A" ශිෂ්‍යයා ලකුණු 80 හෝ ඊට වැඩි නම්, "B" ශිෂ්‍යයා ලකුණු 60 සිට 79 දක්වා නම්, "C" ශිෂ්‍යයා ලකුණු 45 සිට 59 දක්වා නම්, "D" ශිෂ්‍යයා ලකුණු 30 සිට 44 දක්වා නම්, "FAIL" ශිෂ්‍යයාගේ ලකුණු 30 ට අඩු නම්)

[2 Marks]

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

**Question 3**

1. Convert the following numbers and show the way that you have done it. (පහත සඳහන් අංක පරිවර්තනය කර ඔබ එය කළ ආකාරය පෙන්වන්න.)

[1 1/2x 12=18 Marks]

i. Decimal to Binary

a) $(432)_{10} = (?)_2$ b) $(178)_{10} = (?)_2$

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

ii. Decimal to Octal

a) $(890)_{10} = (?)_8$ b) $(679)_{10} = (?)_8$

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

iii. Decimal to Hexadecimal

a) $(111000111)_{10} = (?)_{16}$ b) $(1110011)_{10} = (?)_{16}$

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

iv. Octal to Hexadecimal

a) $(632)_8 = (?)_{16}$ b) $(270)_8 = (?)_{16}$

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

v. Hexadecimal to Binary

a) $(B6D)_{16} = (?)_2$ b) $(10C)_{16} = (?)_2$

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

vi. Subtraction the following numbers

a) $(345)_8-(146)_8 = (?)8$ b) $(757.76)_8-(451.77)_8 = (?)_8$

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

2. List down the steps that are involved in adding a button as "Save" to the form in MsAccess. (MsAccess හි form එකට "save" ලෙස button එක එක් කිරීමට සම්බන්ධ පියවර ලැයිස්තුගත කරන්න.)

[2 Marks]

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

3. Write down the steps, including the formula to get balance according to the interface. (Interface එක අනුව ඉතිරි මුදල ලබා ගැනීම සඳහා සූත්‍රය (formula) සහ ඊට අදාල පියවර ලියන්න.)

[3 Marks]

| | |
|---|---|
| Price for Item | 15 |
| No of Items | 5 |
| Total Amount | 75 |
| Paid Amount | 1000 |
| Balance | 925 |

..........................................................................................................

..........................................................................................................


..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

[2 Marks]

8. Draw the relationship among the following tables according to the primary key and the foreign key with correct symbols. (නිවැරදි සංකේත සහිතව, Primary key සහ foreign key අනුව පහත වගු අතර සම්බන්ධතාවය (relationship) අඳින්න.)



## Question 4

1. **State** whether the following parts of the HTML code segments are syntactically **correct or wrong**. If they are wrong, then make necessary changes to correct them. (පහත සඳහන් HTML Code Segments හි වැරදි (syntax errors) ඇතොත් ඒවා නිවැරදි (syntactically) කර නැවත ලියන්න.)

[2x5=10 Marks]

i.
```
<img src="../a/a.jpg" alt="rose" style="width:100%">
```
..........................................................................................................

..........................................................................................................

ii.
```
<li> <a href="#c">Part C</a></li> <a id="c">
```
..........................................................................................................

..........................................................................................................

iii.
```
<font "colour = #aaee55" font-size : "15px">
```
..........................................................................................................

..........................................................................................................

iv.
```
<td colspan=3 rowspan=3> Sri Lanka</td>
```
..........................................................................................................

..........................................................................................................

v.
```
<a href="application.docx"> Application Form</a>
```
..........................................................................................................

2. Write down the output of the following HTML. (පහත දැක්වෙන HTML හි output ලියන්න)

[2x2=4 Marks]

i.
```
<table width="200" border="1">
<tbody> <tr> <td rowspan="3">f</td>
<td>2</td>
<td colspan="2" rowspan="3">A</td>
<td rowspan="2">B</td> </tr>
<tr> <td>3</td></tr> <tr>
<td rowspan="2">4</td> <td>C</td>
</tr><tr> <td>1</td> <td>D</td>
<td>E</td> <td>F</td> </tr>
<tfoot><tr><td
colspan=5>Numbers</td>
</tr></tfoot> <thead><tr><td>a</td>
<td>b</td> <td>c</td> <td>d</td>
<td>e</td></tr></thead> </table>
```
..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

```
ii.
  <ol> <li>Colombo</li>
  <ol type="i"> <li>Colombo 7</li>
  <ul type="citcle"> <li>Borella</li>
  </ul>
  </ol></ol>
  <ol start="5"> <li>Kandy</li>
  <ol type="a" start="5">
  <li>Galle</li> <li>Nugegoda</li>
  </ol>
```

..................................................
..................................................
..................................................
..................................................
..................................................
..................................................
..................................................

3. Briefly explain the top challenges of electronic commerce today. (අද e-Commerce හි ඇති ප්‍රධාන අභියෝග කෙටියෙන් විස්තර කරන්න.)

[5 Marks]

..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................

4. Identify and discuss the importance of the three e-business areas/ sectors based on the marketplace with suitable examples. (සුදුසු උදාහරණ සහිතව E-Business වෙළඳපල මත පදනම්ව ඇති ක්ෂේත්‍ර / අංශ තුනෙහි වැදගත්කම හඳුනාගෙන සාකච්ඡා කරන්න.)

[6 Marks]

*********

IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - II කොටස - 2018/2019

(ප්‍රථම සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2021 මාර්තු)

## BLE 203 - සමාජ ගවේෂණ ක්‍රම

අයදුම්කරුවන්ට උපදෙස් :

(1) ප්‍රශ්න පහකට **(05)** පමණක් පිළිතුරු සැපයිය යුතුයි.

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු එකකින් (01) සමන්විත වේ

(3) කාලය පැය තුනයි (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01. පර්යේෂණයක් යනු කුමක්ද? විද්‍යාත්මක පර්යේෂණයක පවතින මූලික පියවරයන් සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

02. පර්යේෂණ යෝජනාවලියක් යනු කුමක්ද? පර්යේෂණ යෝජනාවලියක පවතින මූලික පියවරයන් විස්තරාත්මකව පැහැදිලි කරන්න.

(ලකුණු 20)

03. ප්‍රශ්න මාලාවක් සකස් කිරීමේදී අවධාරණය කළ යුතු කරුණු මොනවාද?

(ලකුණු 20)

04. දත්ත රැස්කිරීමේ ප්‍රධාන ක්‍රම නම් කර ප්‍රශ්නමාලා ක්‍රමයෙහි ඇති වාසි අවාසි පැහැදිලි කරන්න.

(ලකුණු 20)

05. සම්මුඛ සාකච්ඡා ක්‍රමයේ ඇති වාසි අවාසි උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

06. නියැදීම යන්න පැහැදිලි කර ප්‍රධාන නියදුම් වර්ග කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

07. සමාජ පර්යේෂණවල දී, පර්යේෂණ ආචාරධර්ම පිළිපැදිය යුත්තේ කුමන හේතු නිසා දැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 20)

08. පහත සඳහන් සියලුම සංකල්ප පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. ප්‍රාථමික දත්ත සහ ද්විතීයික දත්ත
ii. ගුණාත්මක දත්ත සහ ප්‍රමාණාත්මක දත්ත
iii. උපන්‍යාස ගොඩනැගීම
iv. පර්යේෂණ අරමුණු

(ලකුණු 5x4 = 20)

********************************

IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - II කොටස - 2018/2019

(ප්‍රථම සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2021 මාර්තු)

## BLE 204 - කාර්මික සම්බන්ධතා

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ. (I කොටසේ ප්‍රශ්න හතරක් (04) හා II කොටසේ ප්‍රශ්න හතරක් (04) ඇත.)

(2) **I කොටසේ පළමු ප්‍රශ්නය (01) අනිවාර්ය** වන අතර තවත් ප්‍රශ්න දෙකකට (02) පිළිතුරු සැපයිය යුතුය.

(3) **II කොටසේ පළමු ප්‍රශ්නය (01) ප්‍රශ්නය අනිවාර්ය** වන අතර තවත් ප්‍රශ්න දෙකකට (02) පිළිතුරු සැපයිය යුතුය.

(4) පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන හයකි. (06)

(5) **I කොටස හා II කොටස සඳහා වෙන වෙනම පිළිතුරු පොත් භාවිතා කළ යුතුය.**

(6) කාලය පැය තුනයි. (03)

(7) අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.

(8) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(9) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

## I කොටස

01. 'සේවකයින්හට සෞඛ්‍ය සම්පන්න සහ ආරක්ෂිත පරිසරයක් ලබාදීමට ආයතන බැඳී සිටී. සේවා පරිසරයේ භෞතික හා සමාජ මනෝවිද්‍යාත්මක අංශ දෙකම වෘත්තීය සෞඛ්‍යයට සහ ආරක්ෂාවට බලපෑම් කරයි. වෘත්තීය සෞඛ්‍යය හා ආරක්ෂාව වැඩිදියුණු කිරීම සඳහා කළමනාකරණ ප්‍රයත්නය තුල උපද්‍රවකාරී වැඩ පරිසරය ඉවත්කිරීමේ උපාය මාර්ගද අන්තර්ගත විය යුතුය.'

i. ඔබ, කොවිඩ් - 19 වසංගතය සමඟ මෑතකදී මුහුණ දුන් අත්දැකීම මත පදනම්ව ඉහත ප්‍රකාශය පහදන්න.

**(ලකුණු 10)**

ii. මෙම කොවිඩ් - 19 වසංගත තත්වය සමඟ පැනනගින සේවක සෞඛ්‍ය හා ආරක්ෂක ගැටළු සඳහා පිළියම් ඇතුලත් කෙටි වැඩසටහනක් නිර්මාණය කිරීමේ වගකීම ඔබට පැවරී ඇතැයි සිතන්න. ඔබ ක්‍රියාකරන අයුරු කෙටියෙන් පහදන්න.

**(ලකුණු 10)**

**(මුළු ලකුණු 20)**

02.

i. 'සේවකයින් සේවයේ මාරුකිරීම සේවායෝජකයාගේ අයිතියක් වුවද, එය සීමාවන්ට යටත්වේ.' මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟවේද? පහදන්න.

**(ලකුණු 10)**

ii. සේවක උසස්වීම් ලබාදීම සඳහා යොදාගත හැකි නිර්ණායක කවරේද? ඉන් එක් (01) නිර්ණායකයක් කෙටියෙන් පහදන්න.

**(ලකුණු 05)**

**(මුළු ලකුණු 15)**

03.

i. නුවන් මහතා රසායනික ද්‍රව්‍ය ආයතනයක යාන්ත්‍රික ශිල්පියෙකි. දිනක් ඔහු නිෂ්පාදන දෙපාර්තමේන්තුවේ ඔහුගේ සුපරීක්ෂක සමඟ කුපිත වී සුපරීක්ෂකට මහා හඬින් නින්දා සහගත ලෙස බැන වැදුණේය. නුවන් මහතාගේ මෙම හැසිරීම අසාමාන්‍ය දෙයක් විය. නුවන් සඳහා ඔබ නිරවද්‍ය විනය හෝ වළක්වාලීමේ විනය හෝ එම දෙකම හෝ නිර්දේශ කරන්නෙහිද? පහදන්න.

**(ලකුණු 10)**

ii. 'විනය වැරදි මූලික වශයෙන් දෙවර්ගයකි' විස්තර කරන්න.

**(ලකුණු 05)**

**(මුළු ලකුණු 15)**

i. ඔබ ආයතනයක දෙපාර්තමේන්තු ප්‍රධානියකු යයි සිතන්න. ඔබේ දෙපාර්තමේන්තුවේ දුක්ගැනවිල්ලකට ලක්වූ සේවාදායකයෙකු තුල ජනිත වූ මානසික පීඩනය ඉවත් කිරීම පිණිස ඔබ උපක්‍රමික වශයෙන් යොදාගනු ලබන ක්‍රියාමාර්ග කවරේද? පහදන්න.

(ලකුණු 10)

ii. ශ්‍රමික සම්බන්ධතාවලට සම්බන්ධිත ප්‍රධාන පාර්ශව කවරේද? මෙම පාර්ශව අතර අන්තර් රුදියාව කෙටියෙන් පහදන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 15)

## II කොටස

---

සේව්‍ය-සේවක සබඳතාවය තුළ වැඩ වර්ජනය කිරීමට ඇති අයිතිය ප්‍රබල අයිතිවාසිකමක් ලෙස කම්කරු නීතිය මඟින් පිළිගනී. ශ්‍රී ලංකා නීතිය තුළ වැඩ වර්ජනයේ අයිතිය පිළිගෙන ඇති ආකාරය විමර්ශනය කරමින් එම අයිතිය භුක්ති විඳීමට ඇති සීමාවන් අදාල ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

02. කාර්මික ආරවුලක් යන්න විස්තර කොට කාර්මික ආරවුලක් විසඳා ගැනීමට පවතින ක්‍රමවේද කවරේදැයි විස්තර කරන්න. ඒ එක් එක් ක්‍රමවේදයන්හි පවතින උපයෝගීතාවය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

(ලකුණු 15)

03. කාර්මික සුබ සාධනය උදෙසා ශ්‍රී ලංකාවේ පවතින නීතිමය තත්ත්වය, අවම වශයෙන් අදාල ව්‍යවස්ථාවන් 03 ක් ඇසුරෙන් විවේචනාත්මකව විග්‍රහ කරන්න.

(ලකුණු 15)

04. කාර්මික සබඳතා ක්ෂේත්‍රය තුළ සේවා යෝජක සේවක සම්බන්ධතාවයන් කළමනාකරණය කෙරෙහි වෘත්තීය සමිති වල දායකත්වය විවේචනාත්මකව විමසන්න. අදාල ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන මඟින් ඔබේ පිළිතුර සනාථ කරන්න.

(ලකුණු 15)

***************************************************************